**IPRC/16/231**

# බටහිර අභිප්‍රේරණ සංකල්පය සහ බෞද්ධ සමුත්තේජන සංකල්පයපිළිබඳ තුලනාත්මක විග්‍රහයක්

ඩී. එම්. එල්. හර්ෂිකා[1]

බටහිර අභිප්‍රේරණ සංකල්පය මනෝවිද්‍යාව, සමාජ විද්‍යාව, අධ්‍යාපනය, දර්ශනය ආදී බොහෝ විෂය ක්ෂේත්‍රයන් තුළ ප්‍රධාන වශයෙන් භාවිත වන සංකල්පයක් වශයෙන් හඳුන්වාදිය හැකිය. අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා යම් යම් චර්යාවන්හි පුද්ගලයා මෙහෙයවන අභ්‍යන්තරික ක්‍රියාවලිය අභිප්‍රේරණය වශයෙන් හඳුන්වා දී තිබේ. එමෙන් ම මානසික අවශ්‍යතා වැනි අභ්‍යන්තරික මූලයන් මෙන් ම බාහිර ප්‍රබෝධකයන් නිසා ද අභිප්‍රේරණය ශක්තියක් වශයෙන් ක්‍රියාත්මක වන බව මනෝවිද්‍යාඥයින්ගේ අදහස යි. මනෝවිද්‍යාත්මක ව මෙය විග්‍රහ කිරීමේ දී සත්වයා පුබුදු කොට මෙහෙයවමින් නිශ්චිත දිශාවකට යොමු කිරීමේ ගාමක බලවේගය අභිප්‍රේරණය යනුවෙන් නිර්වචනය කළ හැකිය. " අභිප්‍රේරණය" සඳහා විවිධ විෂය ක්ෂේත්‍ර තුළ පර්යාය පද රාශියක් භාවිත වේ. අභිප්‍රායනය, අභිචේතනය, පෙළඹවීම යනු ඉන් කිහිපයකි. එමෙන් ම පුද්ගලයා ක්‍රියාකාරී බවට පත් කරවීම, මෙහෙයවීම, යොමු කිරීම, උත්තේජනය කරවීම ආදී අරමුණු සාධනය කර ගැනීම සඳහා ද මෙම සංකල්පය භාවිත වී තිබේ.

බටහිර චින්තකයන් විසින් නූතනයෙහි අභිප්‍රේරණය නව සංකල්පයක් වශයෙන් හඳුන්වා දුන්න ද මෙයට වසර 2550කට පෙර භාරතයෙහි පහළ වූ ගෞතම බුදුන් වහන්සේ  සත්වයාගේ ලෞකික හා ලෝකෝත්තර අරමුණු සාධනය කර ගැනීම සඳහා මෙම සංකල්පය ප්‍රායෝගික ව භාවිත කළ බව ත්‍රිපිටකය පරික්ෂා කිරීමෙන් සනාථ කර ගත හැකිය. බෞද්ධ දාර්ශනික සිද්ධාන්ත, ධර්ම දේශනා ක්‍රමශිල්ප, සම්මුති පරමාර්ථ ඉගැන්වීම්, බෞද්ධ සාහිත්‍යය ප්‍රකට වන විමාන වත්ථු, ප්‍රේත වත්ථු, ධම්ම පදය, ජාතක කථා සහ ආදි බෞද්ධ සූත්‍ර දේශනා අධ්‍යයනය කිරීමේදී බෞද්ධ අභිප්‍රේරණයෙහි ප්‍රායෝගික භාවිතාව සහ එහි දාර්ශනික අර්ථය ද මනා ව පිළිඹිබු කර යි. එහෙත් "අභිප්‍රේරණය" යන නාමය ත්‍රිපිටකය තුළ හෝ අටුවා, ටීකා වැනි තදනුබද්ද මුලාශ්‍රය තුළ දැකගත නොහැක. මේ සඳහා බුදුදහම භාවිත කොට ඇත්තේ "සමුත්තේජනය" යන නාමය යි.

බටහිර අභිප්‍රේරණ සංකල්පය බෞද්ධ සමුත්තේජන සංකල්පය සමඟ තුලනය කරමින් එහි ප්‍රභවය විකාශය පිළිබඳ ව මෙන්ම එහි සම විෂමතා, පරස්පරතා හා සුවිශේෂතා ද විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීමට මෙහිදී අපේක්‍ෂා කෙරේ. ඒ තුළින් බැසගත හැකි නිගමන ද ඉදිරිපත් කිරීම අපගේ ව්‍යායාමය යි. මේ සඳහා බටහිර අභිප්‍රේරණ සංකල්පය පිළිබඳ විග්‍රහකොට ඇති ප්‍රාමාණික මූලාශය මෙන්ම ත්‍රිපිටකයෙහි අදාළ සූත්‍ර දේශනා මූලාශ්‍රය වශයෙන් භාවිත කිරීමට අපේක්ෂිත ය.

***Keywords:*** *Motivation, Samuttejana, Dhammapadaya, Vimanavaththu, Prethavatthu*

[1] රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *dmharshika@gmail.com